## හින්දු සංස්කෘතික අරමුදල - 2014

හින්දු සංස්කෘතික අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 31 දරණ හින්දු සංස්කෘතික අරමුදල පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකසමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශ සම්බන්ධව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍යප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හින්දු සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීතිරීති යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **2006 දෙසැම්බර් 22 දිනැති අංක පී.එෆ්.423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | |
| (i) 4.1(අ) ඡේදය | අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාල මුදල් වර්ෂයේ කිසිඳු වියදමක් නොදැරිය යුතු වුවත් අරමුදල විසින් සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනයක් සකස්කර අනුමත කර ගැනීමෙන් තොරව වර්ෂයේ වියදම් සිදුකර තිබුණි. |
| (ii) 4.2 ඡේදය | ආයෝජන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අරමුදලේ වැඩකටයුතුවල ප්‍රතිඵලය රු.1,366,697 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේදී රු. 1,969,021 ක අතිරික්තයක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 602,324

ක පිරිහීමක් වූ අතර එයට වෙනත් ආදායම් රු.116,827 කින් අඩුවීම සහ කෝවිල් සඳහා ආධාර හා නිළ ඇඳුම් මිලට ගැනීමේ වියදම් රු.399,050 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

අරමුදලේ ලැබීම්වලින් සියයට 56 ක් නියෝජනය කරන්නේ ස්ථාවර තැන්පතු මඟින් ලැබෙන පොලී ආදායම වන අතර එහි පොලී ප්‍රතිශතයද ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙම වර්ෂයේදී සියයට 12.5 සිට සියයට 7.5 දක්වා අඩු වී තිබුණි. මෙම තත්ත්වය අරමුදලේ ඉදිරි ක්‍රියාකාරීත්වය සඳහා අහිතකර ලෙස බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හින්දු සංස්කෘතික අරමුදලෙහි අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් දේශීය හෝ විදේශීයව එක්රැස් කිරීමේ නෛතික ප්‍රතිපාදන එම පනතෙහි 06 වන පරිච්ඡේදය ප්‍රකාරව ඉඩකඩ සලසා දී ඇතත් එම නෛතික ප්‍රතිපාදන උපයෝගී කරගෙන සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අරමුදල සඳහා සංයුක්ත සැලැස්මක් නොවූ අතර, හින්දු පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම සහ හින්දු ආගම හා සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම යන අරමුදලේ ප්‍රධාන අරමුණු සපුරා ගැනීම සඳහා මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළින් ඉහත අරමුණු ඉටුවී නොතිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සමාලෝචිත වර්ෂයේ දහම් පාසල් ගුරුවරියන් අතර බෙදා දීම සඳහා සාරි 1129 ක ප්‍රමාණයක් මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා එක් සාරියකට රු 1,050 බැගින් රු 1,185,450 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මිලදී ගැනීමට අදාලව අරමුදල හා සැපයුම්කරු අතර විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. මේ අනුව සැපයුම සම්බන්ධයෙන් වූ කොන්දේසි කිසිවක් විගණනයට අනාවරණය නොවීය.

(ආ) සැපයුම්කරු විසින් සාරි තොගය නියමිත පිරිවිතරයන්ට අනුව සපයා ඇති බවට තාක්ෂණ ඇගැයිම් කමිටු වාර්තාවකින් තොරව සැපයුමට අදාළ මුළු මුදලම සැපයුම් කරු වෙත ගෙවා තිබුණි.

**05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව හින්දු කෝවිල් සඳහා ආධාර ලබාදීම, මරණින් නිදහස් කළ ගවයන් නඩත්තුව සඳහා ආධාර ලබාදීම, හා දහම්පාසල් ගුරුවරියන් සඳහා සාරි මිලදී ගැනීම ලෙස ප්‍රධාන වැඩසටහන් 3ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණි. එම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී පහත අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) අරමුදලේ පාලක මණ්ඩලයේ 07 වන සභාවාරයේදී ගන්නා ලද තීරණයකට අනුව කීරමලේ නගුලේස්වරම් කෝවිලේ ගවයෙකු නඩත්තු කිරීම සඳහා මාසයකට රු. 5000 බැගින් රු. 60,000 ක මුදලක් අදාළ කෝවිල වෙත ලබා දීම සඳහා තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් වෙත සමාලෝචිත වර්ෂයේදී චෙක්පත් මඟින් ගෙවා තිබුණි. එම මුදල් අරමුදල අපේක්ෂා කළ අරමුණු ඉටුවන ආකාරයට යොදවා ඇතිද යන්න, පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උත්තරාදී පිල්ලෙයාර් කෝවිලේ හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අන්නායි ශ්‍රී සාරථ දේවි දහම් පාසලේ ගොඩනැගිලි පුනරුත්තාපනය සඳහා රු.300,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ලබාදී තිබුණි. නමුත් මෙම මුදල භාවිතා කළ ආකාරය පිළිබඳ වියදම් වාර්තා හා කළ වැඩ වාර්තා ලබා ගනිමින් ඒ පිළිබඳව පසු විපරම් කිරීමක් සිදුකර නොතිබුණි.

**06. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳ වරින්වර අරමුදලෙහි ලේකම් දැනුවත් කරන ලද අතර පහත ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රසම්පාදනය

(ඇ) සැලසුම්කරණය